**තිහගොඩ ප්‍රාදේශීය සභාව**
**මාතර දිස්ත්‍රික්කය**
**----------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන
-----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 07 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 31 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට තිහගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
--------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ලැබී තිබූ එකතුව රු.192,816 ක් වටිනා ආයුර්වේද ද්‍රව්‍ය ආධාර ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී මිලට ගෙන තිබූ එකතුව රු.311,250ක් වටිනා උපකරණ හා ස්ථාවර වත්කම් සහ ආයුර්වේද මධ්‍යස්ථානයේ රු.205,500 ක් වටිනා රාක්ක 02 හි වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාළව ලැබිය යුතු රු.52,137 ක් වූ ස්ථාවර තැන්පතු පොලී ආදායම ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ නිමකර තිබූ කර්මාන්ත 10 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදනය රු.3,955,288 ක් සහ කර්මාන්ත 13 ක් වෙනුවෙන් ණයගැති ප්‍රතිපාදනය රු. 6,843,030 ක් වැඩියෙන් දැක්වුණි.

(ඉ) කර්මාන්තයක් සඳහා ගෙවා තිබූ රු.398,237 ක මුදල සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම් ණයහිමි යටතේ දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී ණය පදනම මත ලබා ගෙන තිබූ සේවා වෙනුවෙන් ගෙවිය යුතු රු.250,412 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(උ) ප්‍රජා ශාලාවක්, සුසානභූමි දෙකක් සහ තිහගොඩ බස් නැවතුම අසල ඉඩම යන වත්කම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) තාප්පය හා ගොඩනැගිලි වෙන්කිරීමට වැය කල රු.363,040 ක් හා ආදහනාගාරයේ සවිකර තිබූ, විදුලි පංකා 08 ක වටිනාකම රු.93,949 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**

------------------------

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු. 88,496,236 ක් වූ ගිණුම් විෂයයන් 04 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර අසමානතාවල එකතුව රු.1,996,351 ක් විය.

**1.3.3 අවිනිශ්චිත ගිණුම**

--------------------

වර්ෂ කිහිපයක සිට ඉදිරියට ගෙනෙමින් පවතින අවිනිශ්චිත ගිණුමේ වූ රු. 216,311 ක බැර ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.4 ලැබිය යුතු ගිණුම්**

---------------------

ඉකුත් වර්ෂය අවසානයට විවිධ ණයගැති ශේෂය තුල පැවති අවුරුදු 03 ක කාලය ඉක්මවා තිබූ රු. 60,412,156 ක ලැබිය යුතු ශේෂය හඳුනා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී ගිණුම්වලින් ඉවත්කර තිබුණි.

**1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

--------------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.79,575,357 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

**1.3.6 අනුකූල නොවීම**

-------------------

**1.3.6.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

------------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට ආදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 199 | භාණ්ඩ මිලදී ගැනීමට අදාල ගෙවීම් වවුචරයේ අංකය හා දිනය අදාළ පොත් හා ලේඛනවල සඳහන් කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 1645 සහ 1646 | සභාවට අයත් වාහන 14 ක් සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) 2014 දෙසැම්බර් 30 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 2014/3 (i) චක්‍රලේඛය | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල නොවන අයුරින් ප්‍රජා නිලධාරී සඳහා රු. 17,500 ක දුරකථන දීමනාවක් ගෙවා තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,260,925 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,029,839ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්,රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,088,000 | 372,456 | 377,979 | 12,545 | 2,085,700 | 399,273 | 398,140 | 18,068 |
| කුලී | 4,027,000 | 2,940,075 | 3,115,410 | 236,504 | 62,500 | 2,908,525 | 2,775,025 | 411,839 |
| බලපත්‍ර ගාස්තු | 776,800 | 881,912 | 866,442 | 24,930 | 619,000 | 752,780 | 756,560 | 9,460 |
| වෙනත් ආදායම් | 22,310,750 | 12,861,134 | 14,320,961 | 10,078,913 | 23,199,600 | 13,937,498 | 11,219,438 | 11,538,740 |
| -එකතුව- | 28,202,550 | 17,055,577 | 18,680,792 | 10,352,892 | 25,966,800 | 17,998,076 | 15,149,163 | 11,978,107 |

**2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය**

සමාලෝචිත වර්ෂයට ඇස්තමේන්තුගත කළ මුළු ආදායම රු.28,202,550 ක් වූ අතර බිල් කළ ආදායම රු.17,055,577 ක් විය. රු.11,978,107 ක් වූ ආරම්භක හිඟය සමඟ අයවිය යුතු මුළු මුදල රු.29,033,684 ක් වුවද, වර්ෂය තුළ රැස්කළ මුළු ආදායම රු.18,680,792 ක් වීමෙන් වර්ෂය අවසානයට මුළු හිඟය රු.10,352,892 ක් වී තිබුණි.

**2.2.3 වරිපනම් හා බදු**

අක්කර බදු

ආරම්භක හිඟ ශේෂය රු.18,068 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු.2,465 ක් විය. වර්ෂය තුළ මුළු අයවීම් රු.7,988 ක් වූයෙන්, වර්ෂය අවසානයට රු.12,545 ක් හිඟව පැවතුණි. ආරම්භක හිඟයෙන් අයවීම් සියයට 35 ක් තරම් පහළ මට්ටමක පැවතුණි.

**2.2.4 කුලී**

ආරම්භක හිඟ ශේෂය රු.221,839 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු.893,225 ක් විය. වර්ෂය තුළ මුළු අයවීම් රු.903,560 ක් වූයෙන්, වර්ෂය අවසානයට රු.211,504ක් හිඟව පැවතුණි.

**2.2.5 බලපත්‍ර ගාස්තු**

ආරම්භක හිඟය රු.9,460 ක් වූ අතර, රු.522,915 ක් වූ බිල්කිරීම් සමග රු.532,375 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.507,445 ක් වූයෙන්, වර්ෂය අවසානයට රු.24,930 ක් හිඟව පැවතුණි.

**2.2.6 වෙනත් ආදායම්**

**ජල ගාස්තු**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ආරම්භක හිඟ ශේෂය රු.167,666 ක් වූ අතර, රු.294,990 ක් වූ බිල් කිරීම් සමඟ රු.462,656 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ අය කිරීම රු.227,637 ක් වූයෙන්, වර්ෂය අවසානයට රු.235,019 ක හිඟයක් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ජල ව්‍යාපෘතියේ ආදායමට වඩා රු.1,619,992 ක වියදමක් සිදු වී තිබුණි. වර්ෂ තුනකට වැඩි කාලයක් අක්‍රීය වූ ජල මනු වෙනුවට නව ජල මනු සවිකිරිමට කටයුතු නොකිරීම නිසා ස්ථාවර ගාස්තු අයකළ ජල පාරිභෝගිකයින් 26 දෙනෙකුගෙන් තවදුරටත් රු.48,809 ක් හිඟව පැවතුණි.

**2.2.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.366,461 ක් හා මුද්දර ගාස්තු රු.8,400,000 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කාර්යසාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිලිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුබ සාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

-----------------------------------------

සභාව විසින් ජල ව්‍යාපෘතියක් ඉදිකිරීම සඳහා අවශ්‍ය රු.499,472 ක භාණ්ඩ මිලදී ගෙන මාස 06 ට වැඩි කාලයක් ගබඩාවේ නිශ්ක්‍රීයව තිබුණි. ඇස්තමේන්තුගත ප්‍රමාණයට වඩා මිලදී ගෙන තිබූ ජල මනු 34 ක් වෙනුවෙන් රු.115,430 ක් වැඩිපුර ගෙවා තිබූ අතර රු.166,750 ක් වූ ජල මෝටරය ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව මිලදී ගෙන තිබුණි. ජල ව්‍යාපෘතියට අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීමට පමණක් ඇස්තමේන්තු සකසා තිබූ අතර, ව්‍යාපෘතියෙන් ප්‍රයෝජන ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබීම නිසා වැය කරන ලද මුදල නිශ්කාර්ය වී තිබුණි.

#### (ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

සතිපොළවලින් හා පෞද්ගලික සමාගම් මගින් ඉවතලන ඝන අපද්‍රව්‍ය එකතු කිරීම සහ කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය සිදු කරනු ලබන අතර, සමාලෝචිත වර්ෂය තුළ කසළ කළමනාකරණයේ විවිධ ක්‍රියාකාරකම් මගින් රු.247,317 ක මුදලක් උපයා ගෙන තිබුණි. අදාල කාර්යය සඳහා නිලධාරීන් දෙදෙනෙක්, රියදුරන් දෙදෙනෙක් හා ට්‍රැක්ටර් රථ 02 ක් යොදවා තිබුණි. කසළ බැහැර කිරීම වෙනුවෙන් රු.6,333,600 ක වියදම් දරා තිබුණි. නොදිරන කසළ සභා බල ප්‍රදේශයේ ජලාශ්‍රිත ස්ථානයකට අවිධිමත්ව බැහැර කර තිබුණි.

#### (ඇ) පාරිසරික ගැටළු

------------------

1980 අංක 47 දරන ජාතික පරිසර පනත ප්‍රකාර නිකුත් කළ 1533/16 හා 2008 ජනවාරි 25 දිනැති ගැසට් නිවේදනය අනුව බලපත්‍ර ලබා ගත යුතු ව්‍යාපාර ආයතන 35ක් පරිසර බලපත්‍ර ලබා නොගැනීම නිසා සභාවට රු.245,000 ක ආදායමක් අහිමි වී තිබුණි. ඒ අනුව එමගින් සිදුවන පරිසර හානිය පිළිබඳ සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

#### (ඈ) තිරසර සංවර්ධන ඉලක්ක

----------------------------

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ , තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

තිහගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය වරිපනම් අයකිරීමේ කටයුතු සඳහා දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කරමින් 2017 මාර්තු මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික

සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් වරිපනම් කලාප පිහිටුවා වරිපනම් බදු අයකිරීමට සභාව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

2015 වර්ෂයේ සිට විධිමත් අනුමැතියකින් තොරව සභාව විසින් බඳවාගෙන තිබූ සේවකයන් 06 දෙනෙකුගේ වැටුප් හා දීමනා වශයෙන් රු.2,326,532 ක් සභා අරමුදලෙන් වැය කිරීමට සිදුවී තිබුණි. අනුමත කාර්ය මණ්ඩල තනතුරු පුරප්පාඩු 03 ක් සඳහා බඳවා ගැනීම අනුමත කර තිබුණද, ඒ සඳහා බඳවා ගැනීම් කර නොතිබුණි. එමෙන්ම අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 09 ක් සම්පූර්ණකර ගැනීමටත්, සංඛ්‍යාව 15 ක් වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමටත් කටයුතු කර නොතිබුණි.

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

ගබඩාවෙන් නිකුත් කරන ලද රු.519,891 ක වීථි පහන් උපකරණ සවිකර නොතිබුණ අතර විදුලි කාර්මිකගේ වැටුප ලෙස රු.420,091ක් ගෙවා තිබුණි. වීථි පහන් නඩත්තුව ප්‍රමාද වීම හේතුවෙන් 2017 ජුනි 29 දින වෙනත් ආයතනවලින් විදුලි කාර්මිකයන් 37 දෙනෙකු යොදා ගෙන වීථි පහන් 198 ක් නඩත්තු කර තිබූ අතර ඒ සඳහා රු.161,381 ක මුදලක් වැය කර තිබුණි.

**3.5 වාහන උපයෝජනය**

2015 මාර්තු 17 දින සභාවට ලැබී තිබූ රු. 4,500,000 ක් වටිනා ටිපර් රථය 2017 ජුනි 23 දින අනතුරට පත්වී තිබුණි.

(අ) සභාවේ අනුමැතියෙන් තොරව බල ප්‍රදේශයෙන් පිටත ධාවනය වන අතරතුර අනතුරට ලක්වීම නිසා, වර්තමාන තක්සේරු වටිනාකම අනුව රු.3,000,000 ක හානියක් සිදුවී තිබුණි.

(ආ) රියදුරු විසින් හානියට පත් පාර්ශවය වෙත පෞද්ගලික මුදලින් වන්දි ගෙවා තිබූ අතර ටිපර් රථය අළුත්වැඩියාව සඳහා රැගෙන යාමට සහ එහි තිබූ ABC ගල් ප්‍රවාහනය සඳහා රු.130,000 ක වියදමක් සභාව විසින් දරා තිබුණි. එදින සිට අළුත්වැඩියාවක් සිදු නොකර අදාළ රථය ගරාජයේ දමා තිබුණි.

(ඇ) 2016 සැප්තැම්බර් 22 දිනෙන් පසු ධාවන සටහන් විගණනයට ඉදිරිපත් නොකල අතර අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ අයවැයගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත විස්තර දැක්වෙන පරිදි සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(අ) වැය විෂයයන් 07 ක එකතුව රු.12,425,214 ක් වූ ඉතිරිවීම් දක්නට ලැබුණු අතර, එම අගයන් සියයට13 සිට සියයට 90 දක්වා පරාසයක පැවතුණි.

(ආ) ආදායම් විෂයයන් 06 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු.17,913,551 ක් වූ අතර, එම අගයන් සියයට 17 සිට සියයට 66 දක්වා පරාසයක පැවතුණි.

**4.2 අභ්‍යන්තර විගණනය**

----------------------

අභ්‍යන්තර විගණනය පිළිබඳව ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි දැක්වෙන විධිවිධානයන් සහ දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 134 ප්‍රකාර අභ්‍යන්තර විගණන වැඩසටහන් පිළියෙල කිරීමේදී විගණකාධිපති සමඟ සාකච්ඡා කර නොතිබුණු අතර, අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට පියවර ගෙන නොතිබුණි.

**4.3 නොවිසඳි ඇති නිරීක්ෂණ හා පිළිතුරු නොදුන් විගණන විමසුම්**

-------------------------------------------------------------------

පහත සඳහන් විගණන විමසුම්වලට අදාළව 2017 දෙසැම්බර් 31 දින දක්වා පියවර ගෙන නොතිබුණි.

(අ) 1994 වර්ෂයේදී මිලදී ගෙන තිබූ කිතලගම (මධ්‍යම) ග්‍රාම නිලධාරි වසමේ පිහිටි අක්කර 01 ක කුරුඳු වගාව සහිත ඉඩමේ කොටසක නිවාස 02 ක් ඉදිකර නල ජල පහසුකම් හා විදුලියද ලබාගෙන අනවසරයෙන් පුද්ගලයෙකු පදිංචිව සිටීම. සභාව විසින් එම නිවාස 02 පිහිටි කොටස අතහැර ඉඩමේ ඉතිරි කොටසෙහි කටු කම්බි ගසා වෙන්කිරීම හැර, සභාව සතු වත්කම් අවභාවිතාවීම පිළිබඳව හා අනවසර ඉදිකිරීම් පිළිබඳව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබීම.

(ආ) තිහගොඩ ප්‍රාදේශීය සභාවේ කසල කළමනාකරණයේදී නොදිරන ද්‍රව්‍ය කොටස් මගින් පරිසරයට වන හානි වැළැක්වීම සහ අපද්‍රව්‍ය පරිසරයට එක්වීම වැළැක්වීම සඳහා රු.269,287 ක් වටිනා ඝන අපද්‍රව්‍ය පිළිස්සීම් යන්ත්‍රය 2013 මාර්තු 27 දින රේගු බදු රහිතව ලබාගෙන ඇතත්, එම යන්ත්‍රය එදින සිට නිශ්ක්‍රියව තිබීම.

**5. පද්ධති හා පාලන**

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති නමුත් පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ස්ථාවර වත්කම්
(ආ) ආදායම් රැස්කිරීම
(ඇ) අයවැය පාලනය
(ඈ) කොන්ත්‍රාත් පාලනය
(ඉ) ගිණුම්කරණය